ස්වදේශ කටයුතු චක්‍රලේඛ - 8/2017

මගේ අංක - HAF-1/04/විවිධ (ආපදා)
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2017.08. 18

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>හදිසි ආපදා අවස්ථාවලදී කඩිනම් ප්‍රතිචාර දැක්වීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්ට බලය පැවරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළ අංක MDM/MGT/02/Disaster/2 හා 2017.06.21 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි සඳහන් යෝජනා සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්ට බලය පැවරීමට 2017.07.11 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය වී ඇත. ඒ අනුව පහත සඳහන් කාර්යයන් ඉටු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක අමප/17/1335/715/021 මගින් දිස්ත්‍රික් ලේකම්වරුන්ට බලය පැවරේ.

I. හදිසි අවස්ථාවලදී බේරාගැනීමේ මෙහෙයුම් හා සහන සේවා සැපයීම ආදී සියළු කරුණු පිළිබඳව ස්වාධීන තීරණ ගැනීම.

II. හදිසි ආපදාවකදී ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල සේවය කරන අනෙකුත් අමාත්‍යාංශවල නිලධාරීන්ගේ සහයෝගය ලබා ගෙන ආපදා කළමනාකරණ කටයුතු සිදු කිරීම.

III. හදිසි ආපදා තත්ත්වයන් ඇතිවීමේදී ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයක ජන ජීවිතය ආරක්ෂා වන පරිදි දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුදැනුම ඇතිව තීරණ ගැනීමේ හා ඊට අදාළ ආපදා තත්ත්වය ප්‍රකාශයට පත් කරමින් අවශ්‍ය කටයුතු සංවිධානය කිරීමේ බලතල අදාල ප්‍රාදේශිය ලේකම්වරුන්ට පැවරීම.

IV. හදිසි ආපදා අවස්ථාවකදී බේරාගැනීම් මුදවා ගැනීම් හා සහන සැලසීම සඳහා දිස්ත්‍රික්ක තුළ සිටින ස්වේච්ඡා බේරාගැනීමේ කණ්ඩායම් පිළිබඳ තොරතුරු ලබාගෙන හදිසි ආපදාවකදී එම කණ්ඩායම් වල සේවාව ලබා ගැනීම.

V. හදිසි ආපදාවකදී අවස්ථානුකූලව අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට හා අවශ්‍ය කාර්යයන් ඉටුකිරීම.

02. එයට අමතරව ආපදා කළමනාකරණය සඳහා වර්ෂය ආරම්භයේදීම අත්තිකාරම් මුදලක් ලෙස රු.මිලියනයක් දිස්ත්‍රික් ලේකම්වරුන්ට ලබා දීමට , භාණ්ඩාගාරයෙන් මුදල් වෙන් කිරීමටද අනුමැතිය ලබා දී ඇති බැවින් මෙම කාර්යයන් ඉටුකරන ලෙස දන්වා සිටිමි.

නීල් ද අල්විස්
ලේකම්
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

පිටපත - ලේකම්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.